**ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

---

ශීර්ෂය 182 - විදේශ රැකියා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 08 වන දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පැදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,143.81 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,069.21 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 74.60 ක් හෙවත් සියයට 6.52 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 619.36 | 593.45 | 25.91 | 4.18 |
| මූලධන | 524.45 | 475.76 | 48.69 | 9.28 |
| එකතුව | 1143.81 | 1069.21 | 74.60 | 6.52 |

**2.2.** **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 18201 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් සහ තථ්‍ය අගයක් පහත දැක් වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.00 | 18.34 | 6.00 | 12.10 | 50.00 | 31.35 |

**2.3** **විගණන නිරීක්ෂණය**

විදේශ රැකියා අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 03 ඡේදයේ සටහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 18201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේ දී එදිනට හිඟ හිට තිබූ සේවක ණය ශේෂ එකතුව රු.1,124,384 ක් වූ අතර ඉන් රු.226,210 ක් වර්ෂ 01 සිට 03 දක්වා කාල පරාසයක තිබූ නමුත් එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) 2012 නොවැම්බර් 20 දිනැති අංක PFD/ASD/Veh/පොදු/06 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් අමාත්‍යාංශයට අයත් වාහනයක් සම්බන්ධයෙන් වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය නොපමාව සිදුකළ යුතු බව දන්වා ඇත. කෙසේ වුවද, එකී වාහනය වෙනුවෙන් වෙන්දේසි ක්‍රියාවලිය 2017 ජුලි 17 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) විගමණික ශ්‍රමිකයන් සම්බන්ධ පවුල් පැතිකඩ නිර්මාණය කිරීමට අදාල තොරතුරු පරිගණක ගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම අරමුණුගතව 2016 දෙසැම්බර් 06 දින පරිගණක 242 ක් රු.29,995,900 කට මිලදී ගෙන ප්‍රාදේශීය ලේකම්

කාර්යාල වෙත බෙදාහැර මාස 06 ක කාලයක් ගත වී ඇතත් එම තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 කාර්යසාධනය

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2016/01 හා 2016 ජනවාරි 05 දිනැති චක්‍රලේඛය මඟින් 2016 වර්ෂයේ විදේශගත වූ ශ්‍රමික සංඛ්‍යාව සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ වැඩසටහන,2016 ජනවාරි 08 සිට 14 දින දක්වා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබූ අතර එහි ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් විද්‍යුත් මාධ්‍ය සහ පෝස්ටර් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රු.8,284,964 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂය වන විට විදේශගත වූ ශ්‍රමිකයන් ලක්ෂ 20 ක් පමණ සිටිය ද එම කාල පරිච්ඡේදය වන විට ශ්‍රම සුරැකුම යටතේ ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව  ලෙස ලක්ෂ 2 කට ආසන්න අගයක් ගෙන තිබූ අතර එය සියයට 10 ක තරම් අඩු ප්‍රතිශතයක් වී තිබුණි.

(ආ) 2016 නොවැම්බර් 09 දිනැති අමප/16/2048/741/011 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රජයේ කඩිනම් සහන වැඩසටහන යටතේ හඳුන්වා දුන් විගමණික සේවකයන් සඳහා වූ විශ්‍රාම වැටුප් ක්‍රමය නියමිත දින වූ 2017 ජූලි 17 දින වන විටත් මූලික කෙටුම්පත් සකස් කිරීමේ අදියරේ පැවති බව නිරීක්ෂණය විය.

### 3.4 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

--------------------------------------------

අමාත්‍යාංශයට අයත් වාහන 06 ක් සඳහා මිලදී ගත් අමතර කොටස් 31 ක සහ වාහන 07 ක රු.2,187,665 ක අලුත්වැඩියා වියදම් වලට අදාළව ගලවා ඉවත්කළ අමතර කොටස් අමාත්‍යාංශ ගබඩාව වෙත භාර දී නොතිබුණි.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

-------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වයන් පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 11 | - |
| තෘතීයික මට්ටම | 02 | 01 | 01 |
| ද්විතීයික මට්ටම | 1216 | 1029 | 187 |
| ප්‍රාථමික මට්ටම | 29 | 26 | 03 |
| එකතුව | 1258 | 1067 | 191 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය 1,258 ක් වුවත් 2016 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,067 කි. ඒ අනුව කාර්ය මණ්ඩලයෙහි 191 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර ඉන් 176 ක් එනම් සියයට 92 ක් සංවර්ධන නිලධාරීන් බවත් අනාවරණය විය.

විදේශගත වීමට ඉල්ලුම් කරන ගෘහ සේවිකාවන්ගේ පවුල් පසුබිම් වාර්තා ලබා ගැනීම සහ විගමණිකයන්ගේ සුභසාධන කටයුතු ප්‍රදේශීය මට්ටමින් සම්බන්ධීකරණය කිරීම එම නිලධාරීන්ගේ ප්‍රධාන කාර්ය භාරය වන බැවින් මෙසේ පුරප්පාඩු පැවතිම අමාත්‍යාංශයේ කාර්යයන්ට බාධාවක් බව නිරීක්ෂණය විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමේ දී සංවර්ධන නිලධාරීන් 77 දෙනෙකුගේ පුරප්පාඩු තිබෙන අවස්ථාවක නිලධාරීන් 13 දෙනෙකු අතිරික්තව වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන් වෙනුවෙන් 2016 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වැටුප් ගෙවීමට දල වශයෙන් රු.3,684,330 ක් වැය කර තිබූ අතර අතිරික්ත සේවකයින්, පුරප්පාඩු සංඛ්‍යාව අවම වන පරිදි යෙදවීම හා අනෙකුත් පරිපාලන දිස්ත්‍රික්ක වෙත යොමු කිරීමට අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.